" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601; ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone } 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/FIN-BD/01/FI/03-2022 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. } දිනය / திகதி / Date } 2025-12-12

බස්නාහිර පළාත් සභාවේ

සියලුම ලේකම්වරුන්

දිස්ත්‍රික් ලේකම් (කොළඹ/ ගම්පහ/ කළුතර)

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය/ පාලන/ පිරිස් හා පුහුණු/ සැලසුම්/ ඉංජිනේරු)

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

ප්‍රාදේශීය ලේකම්වරුන් (බස්නාහිර පළාත)

පළාත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්

**<u>2026 ඇස්තමේන්තු</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාත් සභාවේ හය වන පළාත් සභා නිල කාලය **2019** අප්‍රේල් මස **21** වන දිනෙන් අවසන් වූ බැවින් **1990** අංක **28** දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත **1987** අංක **42** දරන පළාත් සභා පනතේ **27**අ වගන්තිය අනුව ගරු ආණ්ඩුකාරවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, **2026** වර්ෂය වෙනුවෙන් බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ මුදල් වියදම් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන් විසින් අවසරය ලබා දී ඇත. එම අවසරයෙහි සඳහන් ප්‍රතිපාදනවලට අදාළ මුදල්, සභා අරමුදලින් ඉවත් කර ගැනීමට අධිකාරි බලය ලබා දෙන ලියවිලි සඳහා ගරු ආණ්ඩුකාරතුමන් විසින් **2025-12-05** වන දින අත්සන් තබා ඇත.

**02.** මේ අනුව, ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සලසා ඇති කාර්යය, සැපයුම් හා සේවාවන් වෙනුවෙන් වියදම් දැරීමේදී, ගෙවීම් වවුචර්වල සහ අනෙකුත් ලියකියවිලිවල සඳහන් කළ යුතු අධිකාරි බලය පහත දැක්වෙන පරිදි වේ.

අ. සාමාන්‍ය සේවා සම්බන්ධයෙන් **2026** වර්ෂය සඳහා පළාත් සභා අරමුදලින් මුදල් ඉවත් කර ගැනීමේ අධිකාරි බලය.

ආ. ශීර්ෂ **100, 101, 104, 105, 106, 107** හා **108** යටතේ විශේෂ නීති විෂයයන් සම්බන්ධයෙන් **2026** වර්ෂය සඳහා විශේෂ නීති සේවා වෙනුවෙන් පළාත් සභා අරමුදලින් මුදල් ඉවත් කර ගැනීමේ අධිකාරි බලය.

ඇ. අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් **2026** වර්ෂය සඳහා අත්තිකාරම් කටයුතු වෙනුවෙන් පළාත් සභා අරමුදලින් මුදල් ඉවත් කර ගැනීමේ අධිකාරි බලය.

**03.** අරපිරිමැස්මෙන් කටයුතු කිරීමෙන් සහ නාස්තිය පිටු දැකීමෙන් පළාත් සභා වියදම් පාලනය කිරීමේ වගකීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා ගණන් දීමේ නිලධාරීන් සතු වන්නේය. එබැවින්, ලබා දී ඇති වියදම් සීමාවන් නොඉක්මවන පරිදි ස්වකීය ආයතනවල වියදම් කළමනාකරණය කරගැනීමට සැලසුම් කළ යුතුය. නව බැරකම්වලට බැඳීමට පළමු කොට බේරුම් කිරීමට ඇති බැරකම් බේරා දැමීමට හෝ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කොට තැබීමට කටයුතු කළ යුතුය.

**04.** කවර තත්ත්වයක් යටතේ වුවද අනුමත කළ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා කිසියම් වියදමක් දැරීම හෝ බැඳීම්වලට එළඹීම හෝ නොකළ යුතුය. ඒ අනුව, වර්ෂයේ වියදම් පාලනය කිරීමටත්, මාසිකව සමාලෝචනය කිරීමටත් ගණන් දීමේ නිලධාරීන් විසින් අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය. ඉහළ නංවන ලද ආපදා ණය හිමිකම් සීමා පිළිබඳ අවධානය යොමු කර පළාත් සභා නිලධාරී අත්තිකාරම් ගිණුම්වල උපරිම වියදම් සීමා නිර්ණය කර ඇත. ඒ අනුව, සලසා ඇති උපරිම වියදම් සීමාවන් ඉක්මවා නොයන පරිදි වර්ෂය පුරා දිවෙන ණය ලබා දීමට සුදුසු ප්‍රමුඛතා අනුපිළිවෙලක් සකස් කර අනුමත සීමා තුළ කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය.

**05.** අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක යෙදවුම් යටතේ වෙන් කළ ප්‍රතිපාදන තුළින් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් පිළිබඳ විස්තර අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව මා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ක්‍රියාත්මක කළ යුතුය. පුහුණු වැඩසටහන්, වැඩමුළු වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති අනෙකුත් කාර්යාලවල වාර්ෂික ක්‍රියාත්මක වැඩසටහන් විස්තර අදාළ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

**06.** අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත පාසල් පෝෂණ වැඩසටහන සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වියදම් දැරීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය හා මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශයන් අනුව කටයුතු කළ යුතු අතර ඒ අනුව, පළාතේ පාසල් දරුවන්ගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීමේ කටයුතු සාර්ථක කර ගැනීම අපේක්ෂා කෙරේ.

**07.** විදේශ ගමන් වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, අමාත්‍යාංශ යටතට නොගැනෙන කාර්යාල සඳහා ඒ ඒ ශීර්ෂ යටතේත්, **109, 110** හා **111** ශීර්ෂ සඳහා වන ප්‍රතිපාදන **109** ශීර්ෂය යටතේත්, අමාත්‍යාංශ හා ඒ යටතේ වන අනෙකුත් දෙපාර්තමේන්තු සඳහා අමාත්‍යාංශ ශීර්ෂය යටතේත් **2026** මුදල් ප්‍රකාශය මගින් වෙන් කර ඇත. එලෙස ප්‍රතිපාදන වෙන් කළද විදේශ ගමන් සඳහා නිලධාරීන් යොමු කිරීමේ ක්‍රමවේදයන් පෙර පැවති අයුරින්ම බල පැවැත්විය යුතුය.

**08.** පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් භාණ්ඩාගාරය විසින් දැනට ලබා දී ඇති උපදෙස් හා මුදල් කොමිෂන් සභා නිර්දේශ පරිදි මහ නගර සභා සඳහා **60%** ක සහ නගර සභා හා ප්‍රාදේශීය සභා සඳහා **80%** ක ද වැටුප් ප්‍රතිපූරණය සඳහා ප්‍රතිපාදන සලසා දී ඇත. එසේ වුවත් **2026** අයවැය යෝජනා අනුව මුදල් කොමිෂන් සභාව විසින් දන්වා ඇති පරිදි වැටුප් ප්‍රතිපූරණය සම්බන්ධයෙන් පවතින ක්‍රමවේදයේ ඉදිරියේදී සිදු කිරීමට යෝජිත සංශෝධනයන් දන්වා එවීමට කටයුතු කරනු ලැබේ.

**09.** නඩත්තු කාණ්ඩය යටතේ වන පුනරාවර්තන වියදම් සඳහා මුදල් කොමිෂන් සභා නිර්දේශ පරිදි එක් එක් වැය ශීර්ෂ වෙත ප්‍රතිපාදන සලසා දී ඇත. නඩත්තු ක්‍රියාකාරී වැඩසටහන වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන උපයෝජනය කිරීමේදී මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු බවද දන්වා සිටිමි.

**10.** ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කරන ලද **2026 වර්ෂය සඳහා බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ මුදල් වියදම් කිරීම සඳහා වන අවසරය හා 2026 මුදල් ප්‍රකාශය** ප්‍රධාන ලේකම් කාර්යාලයේ මූල්‍ය අංශයේ වෙබ් අඩවියේ පළ කෙරෙන අතර අවශ්‍ය කෙරෙන පිටපත් ඉන් ලබා ගත හැකි බවද කාරුණිකව සලකන්න.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර**
ප්‍රධාන ලේකම්
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්
බස්නාහිර පළාත

දුරකථන:- **0112 092 645**
විද්‍යුත් තැපැල:- wpcsfbudget@gmail.com
ෆැක්ස්:- **0112 092 636**

බාගත කිරීම් සඳහා යොමුව-
fin.chiefsec.wp.gov.lk → Downloads → Financial Statements → **2026**

පිටපත :- 01. විගණකාධිපති - කරු.දැ.ගැ.ස.
02. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) - කරු. දැ.ගැ.ස.
03. අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) - කරු. දැ.ගැ.ස.